# හද රිදවන මතක සුවඳ



24

1971 කැරැල්ලේදී ව්‍යාපාරය (ජ.වි.පෙ.ට) සැබෑ ලෙසම ද්‍රෝහිකම් කළවුන් හා විවිධ හේතු සාධක මත ව්‍යාපාරය විසින් ද්‍රෝහීන් යයි හංවඩු ගසන ලද පුද්ගලයින් තොග ගණන් සිටියහ. ඉන් ඇතමෙක් වර්තමානයේ පවා ජ.වි.පෙ.ට ද්‍රෝහිකම් කරමින් සිටිති. එහෙත් විස්මයට කාරණය නම් 1987 – 89 දේශප්‍රේමී අරගලයෙන් පසුව ද්‍රෝහීන් වශයෙන් හැඳින්වෙන කිසිවෙක්ම නොවීමයි.

71 කැරැල්ලෙන් පසුව එවකට සිටි පාලකයන් විසින් දූෂණයට ලක්කරන ලද නීතියක් හෝ රටේ පැවැති බැව් පෙනී ගියේ අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභා පනත නම් වූ විශේෂ පනතක් හා කොමිසමක් මගින් රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණකරුවන් ලෙස 41 දෙනෙකු නම්කොට, රාජ්‍ය විරෝධී අප්‍රේල් කැරැල්ල නමින් මහ නඩුවක් ඇසූ නිසාය.

එහෙත් 1987 – 89 දේශප්‍රේමී අරගලය පවතින අතරතුර ද ඉන් පසුව ද පෙනී ගියේ ශ්‍රී ලංකාව නීතියක්, අධිකරණයක්, යුක්තියක් නොමැති රටක් වශයෙනි. රාජ්‍ය බලය පැහැර ගැනීම සඳහා ඒ සා දැවැන්ත කැරැල්ලක් දියත් වීත් චෝදනා ඉදිරිපත් කොට, නඩුවක් ගොනුකොට, අධිකරණයකට ඉදිරිපත් කිරීමට කිසිම චූදිතයෙකු නොවීය.

ජනතා විමුක්ති පෙරමුණේ ඉහළම නායකයන් දෙදෙනා වන, එනම් ජ.වි.පෙ. සභාපතිවරයා සහ ලේකම්වරයා වන රෝහණ විජේවීර හා උපතිස්ස ගමනායක යන දෙදෙනා හමුදා අත්අඩංගුවට පත්වූයේ මහා පාවාදීමකින් බව අවිවාදිතය. එම පාවාදෙන්නා වූයේ කවරෙක්ද ? ප්‍රශ්නය මතුවෙන්නේ මෙන්න මෙතනදී ය.

විජේවීර, ගමනායක යන සහෝදරවරුන් හමුදා අත්අඩංගුවට පත්වූයේ කෙසේද යන ප්‍රශ්නය සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණේ අති බහුතර සාමාජිකයන්ට අද පවා පැහැදිලි, නිශ්චිත පිළිතුරක් තිබේද ? නැත. පොදුවේ ගත්කල වැඩි දෙනෙකු දන්නේ ඩී. එම්. ආනන්ද නම් වූ නායකයා විසින් ඔවුන් දෙදෙනා හමුදාවට පාවාදුන් බවකි.

හමුදා වධකාගාරයක දරුණු වධ බන්ධනවලට ලක්කරන ලද එච්.බී. හේරත් විසින් තම නායකයන් දෙදෙනා පාවාදුන් බවට ද කථාවක් ඇත. රෝහණ සහෝදරයා අත්අඩංගුවට ගැනීමට ගිය හමුදා කණ්ඩායම සමඟ රැගෙන යනු ලැබූ එච්.බී. හේරත් මගදී හිත වෙනස් කරගෙන තම පාවාදිය නොහැකි යයි හඬ වැටුණ බවද එහෙත් අවසානයේ උලපනේ සාන්ත සෙරී වත්තට ඔහු මඟ පෙන්වූ බවට ද පුවතක් තිබේ. මෙම පුවත විශ්වාස කළ නොහැකි හේතුවක් තිබේ. වර්තමානයේ ජ.වි.පෙ. විසින් පවත්වන 'ඉල්මහ සමරු' වලදී එච්.බී. හේරත් ද සැමරෙයි. ඔහු ගැන සැමරුම් සටහන් ඇති ජ.වි.පෙ. ජාත්‍යන්තර ප්‍රකාශන තිබේ. එච්.බී. හේරත් ඒ සා දැවැන්ත ද්‍රෝහිකමක් කළේ නම් ඔහු සැමරුම්වලට ලක්වෙතැයි සිතිය හැකිද ?

එහෙත් ඩී. එම්. ආනන්ද සැමරුම්වලට

**එහෙත් දේශපාලන උපක්‍රමයක් වශයෙන් හෝ වෙනත් කරුණක් මත හෝ ධනේෂ්වරයේ පාලකයෙකු සමඟ ජ.වි.පෙ. සබඳතා පැවැත්වීය. ඒ ආර්. ප්‍රේමදාස මහතා සමඟය. ආර්. ප්‍රේමදාස මහතා සමඟ සබඳතා නොපැවැත්වීයයි, සාකච්ඡා නොපැවැත්වී යයි ජ.වි.පෙ.ට කිව නොහැකි ය. පක්ෂය තහනම් කළ, පක්ෂයේ සාමාජිකයන් දරුණු ලෙස මර්දනයට ලක් කරන ජේ. ආර්. කෙරෙහි ජ.වි.පෙ. තුළ පැවතියේ තදබල වෛරයකි.**

ලක් නොවෙයි. ඒ අරුතින් මේ වාර්තාගත පාවාදීම කරන ලද්දේ ඔහු විසින් යයි නිගමනයකට එළඹිය හැකිය. එසේ වුව ජ.වි.පෙ. විසින් ඩී. එම්. ආනන්ද ද්‍රෝහයෙකු වශයෙන් නොහඳුන්වන අතර ඔහු කෙරෙහි සානුකම්පිතව බලන බවක්ද හැඟීයයි. මේ පාවාදීමේ කතාන්තරය ඇතුළත මහා අභිරහසක් වන් තවත් අතුරු කතාන්තර ඇතැයි පෙනී යන්නේ එවිටය.

එහි පළමුවැනි කථාව මෙසේ යයි දැක්විය හැකිය.

ඩී. එම්. ආනන්ද සාමාන්‍ය මිනිසෙකුට උසුලාගෙන සිටීමට නොහැකි තරම් දරුණු වූ වධ බන්ධනවලට ලක්විය. අවසානයේ ඔහු තම නායකයා හා උපනායකයා පෙන්වාදීමට එකඟ විය. ඩී. එම්. ආනන්ද රෝහණ සහෝදරයා සමඟ එක පෙළට තැබිය හැකි දක්ෂ කථිකයෙකුද, දක්ෂ සංවිධායෙකු ද වෙහෙස නොබලා වැඩ කරන්නෙකු වුවද ඔහුගේ විප්ලවවාදී ජීවිතයේදී පොලීසියකින් හෝ බන්ධනාගාරයකින් ශාරීරික අඩම්තේට්ටම්වලට මුහුණ දී නොසිටියෙන් මෙවැනි වධවේදනාවන් විඳීමට ප්‍රායෝගික අත්දැකීම් ලබා නොසිටියෙකු විය. එසේම ඔහු කාලයක් කිසිවෙකුගෙන් පරුෂ වචනයක්වත් නෑසූ ශ්‍රමණ ජීවිතයක් ගත කෙරුවෙකු බැවින් මෙම ශාරීරික වධවේදනා වලදී මානසිකව කඩා හැලෙන්නට ඇත.

**පොදුවේ ගත් කළ ලෝකයේ කිසිදු විප්ලවවාදී ව්‍යාපාරයක් එරටේ ඒකාධිපතියා, ආඥාදායකයා හෝ ධනපති පාලකයා සමඟ සම්බන්ධකම් පවත්වා නැත. වී.අයි. ලෙනින් සාර්ලා සමගත්, පිදෙල් කැස්ත්‍රෝ - බැටිස්ටා සමඟත් කිසිදු සම්බන්ධයක් පැවැත් වූ බවට ආරංචියක් නැත. ණීඅප ධනේෂ්වර පාලකයන් සමඟ අතරමග සමාදානයකින් සාකච්ඡාවකින්, සම්මුතියකින් තොර අනවරත අරගලයක් කරන්නෙමු□ යි ප්‍රසිද්ධ මහජන රැස්වීම්වලදී ජ.වි.පෙ.පවසා ඇත්තේ ප්‍රතිඥා දී ඇත්තේ වරක් දෙවරක් නොවේ.**

තවත් අනුමාන මතයක් නම් රහස් තොරතුරු ලබාගත යුතු සිරකරුවන් ගැඹුරු නිද්‍රාවකට පත්වන එන්නතක් ලබා දී මෝහන වෛද්‍යවරයෙකු මගින් තොරතුරු ලබාගත් බවයි.

කෙසේ වුවද උපතිස්ස ගමනායක සහෝදරයා අල්ලා දීමට පැමිණියේ ඩී. එම්. ආනන්ද බවට ප්‍රබල සාක්ෂියක් තිබේ. ඒ ගමනායක සහෝදරයාගේ දරුවන් දෙදෙනාගෙන් අයෙකු ය.

"තට්ටෙ තියෙන මාමා ආමි ජිප් එක ඇතුළෙ හිටියා." ය යන්න එම සාක්ෂියයි. ඩී. එම්. ආනන්ද 1984 දී පමණ මාතර දිස්ත්‍රික්කය භාරව වැඩකළේ 'අමල්' නමිනි. එකල ද ඔහුගේ තට්ටය පෑදී තිබුණ බව මට මතකය.

දෙවැනි කථාන්තරය තරමක් දීර්ඝ හා සංකීර්ණ එකකි.

පොදුවේ ගත් කළ ලෝකයේ කිසිදු විප්ලවවාදී ව්‍යාපාරයක් එරටේ ඒකාධිපතියා, ආඥාදායකයා හෝ ධනපති පාලකයා සමඟ සම්බන්ධකම් පවත්වා නැත. වී.අයි. ලෙනින් සාර්ලා සමගත්, පිදෙල් කැස්ත්‍රෝ - බැටිස්ටා සමඟත් කිසිදු සම්බන්ධයක් පැවැත් වූ බවට ආරංචියක් නැත. "අප ධනේෂ්වර පාලකයන් සමඟ අතරමග සමාදානයකින් සාකච්ඡාවකින්, සම්මුතියකින් තොර අනවරත අරගලයක් කරන්නෙමු" යි ප්‍රසිද්ධ මහජන රැස්වීම්වලදී ජ.වි.පෙ.පවසා ඇත්තේ ප්‍රතිඥා දී ඇත්තේ වරක් දෙවරක් නොවේ.

එහෙත් දේශපාලන උපක්‍රමයක් වශයෙන් හෝ වෙනත් කරුණක් මත හෝ ධනේෂ්වරයේ පාලකයෙකු සමඟ ජ.වි.පෙ. සබඳතා පැවැත්වීය. ඒ ආර්. ප්‍රේමදාස මහතා සමඟ ය. ආර්. ප්‍රේමදාස මහතා සමඟ සබඳතා නොපැවැත්වීයයි, සාකච්ඡා නොපැවැත්වී යයි ජ.වි.පෙ.ට කිව නොහැකි ය. පක්ෂය තහනම් කළ, පක්ෂයේ සාමාජිකයන් දරුණු ලෙස මර්දනයට ලක් කරන ජේ. ආර්. කෙරෙහි ජ.වි.පෙ. තුළ පැවතියේ තදබල වෛරයකි. දේශප්‍රේමී ජනතා ව්‍යාපාරයෙන් අලවන ලද එක් පෝස්ටරයක වූයේ 'ජේ. ආර්. මරමු' යන්න ය. ආර්. ප්‍රේමදාස අගමැතිවරයා ඉන්දියානු මැදිහත්වීමට විරෝධය දක්වන්නෙකු වූයෙන් ජ.වි.පෙ. ඔහු හැඳින්වූයේ දේශප්‍රේමියෙකු වශයෙනි. දේශප්‍රේමී අරගලය සඳහා තමන් සමග ඔක්වන කණ්ඩායම් අතර දේශප්‍රේමී ප්‍රේමදාස පිල ද සිටින බව දේ.ජ. ව්‍යාපාරයේ පෝස්ටරවල ද සඳහන් විය. එසේම ජේ. ආර්. හා ඔහුගේ සහචරයෝ ජ.වි.පෙ.ත්‍රස්තවාදීන් ලෙස හඳුන්වද්දී ආර්. ප්‍රේමදාස ජ.වි.පෙ. වෙනුවෙන් ප්‍රසිද්ධියේ පෙනී සිටියේ ය.

අධිකරණයකින් වැරදිකරුවෙකු කරන තුරු ජ.වි.පෙ. කිසිම චෝදනාවකට වැරදි කරුවෙකු නොවේ යයි ඔහු ප්‍රසිද්ධියේම ප්‍රකාශ කළේ ය.

ආර්. ප්‍රේමදාස මහතා සමඟ සාකච්ඡා කිරීමට පක්ෂය වෙනුවෙන් යවන ලද්දේ ඩී. එම්. ආනන්ද ය. මෙය එක් වරක් දෙවරක් පැවති සාකච්ඡාවක් නොව බොහෝ වාර ගණනක් පැවති සාකච්ඡා වටයකි. ආර්. ප්‍රේමදාස මහතා මියගිය පසුව ඔහුගේ ප්‍රවෘත්ති රාජ්‍ය ඇමතිව සිටි ඒ. ජේ. රණසිංහ මහතා 'දිවයින ඉරිදා සංග්‍රහය' සමග සාකච්ඡාවක් පවත්වමින් මෙසේ කියා සිටියි. සාකච්ඡාව පවත්වා ඇත්තේ 'ජටිල වැල්ලබඩ' මහතාය.

"මම ජනාධිපතිතුමාට ඩී. එම්. ආනන්ද පිළිබඳව දැන්වූවා. ඩී. එම්. ආනන්ද තුළින් තමයි අපිට පුළුවන් උනේ ජ.වි.පෙ. සටන් මධ්‍යස්ථානය මෙහෙය වූ බස් හා රෝහල් වර්ජනය වළක්වා ගන්න. ඩී. එම්. ආනන්ද මට හඳුන්වා දුන්නේ රුක්මන් සේනානායක මහත්මයා. රුක්මන් මට ඔහු ගැන විස්තර කියපු දිනයේ දී මම යම් ස්ථානයකට ගියා. එතැන ජ.වි.පෙ. ට සම්බන්ධ අය කිහිප දෙනෙක් හිටියා. සමහරු අව් කණ්ණාඩි පැලඳ ගෙන හිටියේ. රුක්මන් සහ මම මේ අය ජනාධිපති ප්‍රේමදාස මහතා වෙත රැගෙන ගියා. පසුව මම පමණක් කිහිප විටක්ම ඩී. එම්. ආනන්ද ජනාධිපතිවරයා වෙත ගෙන ගොස් තිබෙනවා.

ලබන කලාපයට

රෝහිත මුණසිංහ
ප්‍රංශයේ සිට